අල්ලාහ්ගේ දූතයාණන් වුළු ධෝවනය කළ අයුරින් ඔවුනට ඔහු වුළු ධෝවනය කර පෙන්වීය

අම්ර් බින් යහ්යා අල්-මාසිනී (රහිමහුල්ලාහ්) විසින් වාර්තා කරන ලදී. “මම අම්ර් බින් අබිල් හසන් තුමා ව මුණ ගැසුණෙමි. එතුමා අබ්දුල්ලාහ් බින් සෙයිද් තුමාණන්ගෙන් අල්ලාහ්ගේ දූතයාණන් වුළු ධෝවනය කළ අයුරු පිළිබඳ ව විමසූවේය. පසු ව කුඩා ජල
බඳුනක් ගෙන්වා ගෙන අල්ලාහ්ගේ දූතයාණන් වුළු ධෝවනය කළ අයුරින් ඔවුනට ඔහු වුළු ධෝවනය කර පෙන්වීය. ඔහු කුඩා බඳුන ඇල කර තම දෝතට ජලය වක්කර තම දෙඅත් තුන්වරක් සෝදා ගත්තේය. පසු ව කුඩා බඳුන තුළට දෙ අත් දමා දෝතින් තුන්වරක් ජලය ගෙන කට කලත්වා සෝදා පසුව නාසයට ජලය යාමට සලස්වා පිරිසිදු කර ගත්තේය. පසු ව තම දෑත එම කුඩා බඳුනට දමා තම මුහුණ ද තුන්වරක් සෝදා ගත්තේය. පසු ව තම දෑත එම කුඩා බඳුනට දමා දෙඅත් වැළමිට දක්වා දෙවරක් සෝදා ගත්තේය. පසු ව තම දෑත එම කුඩා බඳුනට දමා එයින් තම හිස පිරිමැද්දේය. එක් වරක් දෑත් ඉදිරියෙන් ආරම්භ කර පසුපසට ගෙන ගියේය. පසු ව දෙපා වළලු
කර දක්වා සෝදා ගත්තේය.” [صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වුළූ කළ ආකාරය අබ්දුල්ලාහ් ඉබ්නු සෙයිද් (රළියල්ලාහු අන්හු) තුමා ප්රයෝගික ක්රියාකාරකම් හරහා පැහැදිලි කළේය. එතුමා කුඩා වතුර බඳුනක් ඉල්ලා සිටියේය. පළමුව ඔහුගේ අත් දෙක සෝදමින් ආරම්භ කළේය. ඔහු කුඩා බඳුන ඇල කර තම දෝතට ජලය වක්කර ඒ දෙක බඳුනට පිටතින් තුන්වරක් සෝදා ගත්තේය. පසු ව බඳුන තුළට දෙ අත් දමා දෝතින් තුන්වරක් ජලය ගෙන සෑම අහුරකින්ම කට කලත්වා සෝදා පසුව නාසයට ජලය යාමට සලස්වා පිරිසිදු කර ගත්තේය. පසු ව බඳුනින් ජලය අහුරා ගෙන තම මුහුණ ද තුන්වරක් සෝදා ගත්තේය. පසු ව ඉන් අහුරා ගෙන තම දෑත වැළමිට දක්වා දෙවරක් බැගින් සෝදා ගත්තේය. පසු ව තම දෑත එම කුඩා බඳුනට දමා එයින් තම හිස පිරිමැද්දේය. එක් වරක් දෑත් ඉදිරි හිසෙන් ආරම්භ කර පසුපස ගෙල දක්වා ගෙන ගොස් නැවතත් ආරම්භ කළ ස්ථානය දක්වා ගෙන ආවේය. පසු ව දෙපා වළලු කර සමග සෝදා ගත්තේය.

http://www.sunnah.global/hadeeth/si/show/3444